MODULE 7

# ඩිජිටල් සක්‍රීය බව උසස් කිරීම

## ප්‍රකාශනය

පළමු ප්‍රකාශනය 2020 මාර්තු

ප්‍රකාශනය :

**MinorMatters** - ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සන්ධානයෙහි **(NCEASL)** මුල පිරීමකි

වෙබ් අඩවියඨ **www.minormatters.org**

සංස්කාරකඨ නාලක ගුණවර්ධන

ව්‍යාපෘති සම්බන්ධීකරණය:

යාමිණී රවින්ද්‍රන් - අධ්‍යක්ෂක, නීති සහ උපදේශන
ෂලෝම් ඩැනියෙල් - නීති සහ උපදේශන සම්බන්ධීකාරක, ආගමික නිදහස සහ සමාජ සාධාරණ කොමිෂන් සභාව
අක්ෂිණා පළිහවඩන - මාධ්‍ය මූලෝපාය නිලධාරී, ආගමික නිදහස සහ සමාජ සාධාරණ කොමිෂන් සභාව

පිට කවර නිර්මාණය: සංජයන් අරියදුරෙ

පිටු පිරිසැලසුම සහ නිර්මාණය: ෂෙනල් ජෙසුඩියන්

Commons Attribution-ShareAlike 3.0 IGO (CC-BY-SA 3.0 IGO) license
බලපත්‍රය යටතේ මෙය භාවිතා කළ හැක.
http://creativecommons.org/licenses/by-sa/3.0/igo/

වියාචනය:

මෙම ප්‍රකාශනයේ අන්තර්ගත විශ්ලේෂණයන් අදහස් දායකයින්ගේ සහ සංස්කාරකවරුන්ගේ අදහස් වේ. ඔවුන් ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සන්ධානයේ සාමාජිකයන් නොවන අතර සංවිධානය නියෝජනය නොකරයි.

# ඩිජිටල් සක්‍රීය බව උසස් කිරීම

සක්‍රීයබව (Activism) යන වදනින් අදහස් වන්නේ පොදු වැදගත්කමක් ඇති ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ සහ සාමකාමී ලෙස පුද්ගලයකු හෝ කණ්ඩායමක් ක්‍රියාත්මක වීම යි.

මෙම ප්‍රශ්නය සමාජ, දේශපාලනික, පාරිසරික හෝ සෞඛ්‍යය සහ ආරක්ෂාව සම්බන්ධ කරුණක් විය හැකි ය. ක්‍රියාධරයන්ට පවත්නා තත්වය වෙනස් කිරීමට අවශ්‍ය ය. ඔවුන් තිබෙන තත්වය ගැන සතුටු නැත. එබැවින් ක්‍රියාධරයන් ප්‍රජා මට්ටමේදී, පළාත් පාලන ආයතන සමග, ජාතික ආණ්ඩු සමග හෝ ඇතැම් විට අන්තර්ජාතිකව, වෙනස වෙනුවෙන් ක්‍රියාකාරී වනු ඇත.

ඩිජිටල් හෝ සයිබර් ක්‍රි සක්‍රීයබව යනු අන්තර්ජාලය සහ ඩිජිටල් තාක්ෂණයන් ප්‍රධාන දැනුවත් කිරීමේ, බලමුළුගැන්වීමේ සහ ක්‍රියාකාරිත්වයේ මෙවලම් ලෙස භාවිතා කරන ක්‍රියාකාරිත්ව ස්වරූපයකි. අනෙකුත් සියලු ආකාරවල සක්‍රීය වීම් මෙන් ම එය ද සාමකාමී හා ආචාරධාර්මික විය යුතු ය.

මෙම පරිච්ඡේදයේදී අප කෙටියෙන් විමසන්නේ ශ්‍රී ලංකාවේ සහ වෙනත් තැන්වල ක්‍රියාත්මක වන විවිධ වර්ගවල ඩිජිටල් ක්‍රියාකාරකම් ය. අපගේ අරමුණ වන්නේ පුද්ගල ක්‍රියාධරයන් සහ තරුණ සංවිධාන වැනි සිවිල් සමාජ කණ්ඩායම් විසින් අනුගමනය කරනු ලබන පොදු උපායමාර්ගයන් හඳුනාගැනීමයි.

අන්තර්ජාලය විසින් නව ස්වරූපයක සක්‍රීය වීම්වලට හැකියාව ලබා දෙන බව ද අපි දකින්නෙමු. එසේ වන්නේ, සමාන අදහස් දරන කණ්ඩායම් ක්ෂණිකව ඒකරාශී කර බලමුළුගැන්වීමෙනි.

සාර්ථක සක්‍රීය වීම් තනිකර ම අන්තර්ජාලයේ පමණක් සිදු විය නොහැකි බව අපි අවධාරණය කරන්නෙමු. ඒ සඳහා අන්තර්ජාලයේ සහ සමාජයේ ක්‍රි සක්‍රීය වීම්වල යහපත් සම්මිශ්‍රණයක් අවශ්‍ය ය.

# ප්‍රධාන යෙදුම්

උද්දේශනය (**Advocacy**)ඃ පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් දේශපාලන, ආර්ථික සහ සමාජ පද්ධති තුළ තීරණවලට බලපෑම් කිරීමේ ක්‍රියාකාරිත්වය උද්දේශනයයි. උද්දේශනයට පොදු ප්‍රතිපත්තිවලට, නීතිවලට, රෙගුලාසිවලට හෝ අයවැයට බලපෑම් කිරීමේ ක්‍රියාකාරිත්වයන් අයත් වේ. ඒ සඳහා කරුණු, තර්ක, මාධ්‍ය භාවිතය සහ වෙනත් ආකාරවල පණිවුඩ රජයේ නිලධාරීන්ට හා/හෝ මහජනයාට යොමු කිරීම තිබේ.

ක්‍රියාකාරිත්වය (**Activism**)ඃ සමාජ හෝ දේශපාලනික වෙනස ඇතිකිරීම සඳහා ශක්තිමත් ලෙස ක්‍රියාමාලාවල යෙදීමේ ප්‍රතිපත්තිය හෝ ක්‍රියාව ක්‍රියාකාරිත්වයයි.

ක්ලික්ටිවිස්ම් (**Clicktivism**)ඃ දේශපාලන හෝ සමාජ අරමුණකට අන්තර්ජාලය ඔස්සේ සමාජ මාධ්‍ය හෝ අන්තර්ජාල පෙත්සම් භාවිතා කරමින් සහයෝගය දීමේ භාවිතාව මෙනමින් හැඳින්වේ. එහිදී දැරිය යුතු වන්නේ අවම උත්සාහයක් හා ඇපකැප වීමකි.

ස්ලැක්ටිවිස්ම් (**Slacktivism**)ඃ සහභාගිකයන්ගේ පැත්තෙන් කිසිදු ප්‍රයත්නයක් නොමැතිව සමාජ අරමුණකට හෝ ප්‍රශ්නයකට හෝ සහාය දැක්වීමේ සරල ආකාරය මෙනමින් හැඳින්වේ. මෙම ක්‍රියාකාරිත්වවලදී අව්‍යාජ කැපවීමක් නොමැති බව හා කිසිදු ස්පර්ශක ප්‍රතිඵලයක් ඇති කිරීමට අසමත් වීම මේ සම්බන්ධයෙන් ඇති විවේචනයයි.



Source: http://www.ictliteracy.info/

## සක්‍රීය වීම:

## මෙතෙක් කතාව

සක්‍රීය වීම ද ශිෂ්ටාචාරයේ ඉතිහාසය තරම් ම පැරණි ය. වෙනස සඳහා ඇති උවමනාව සහ ඒ වෙනුවෙන් පෙනී සිටීමේ සාමූහික උවමනාව විසින් ගැහැනුන් සහ පිරිමින් සියවස් ගණනක් තිස්සේ සක්‍රීය වීම් වෙත පොළඹවා තිබේ.

සක්‍රීය වීම යනු උද්ඝෝෂණයට වැඩි දෙයකි. ඇත්තෙන් ම, ලොව පුරා ක්‍රියාකාරිත්වයේ ඉතිහාසය විසින් පෙන්වා දෙන්නේ වඩාත් ම එලදායී ක්‍රියාධරයන් වන්නේ ප්‍රශ්න විශ්ලේෂණය කරන, පුළුල් ලෙස සවන් දෙන සහ විවිධ ක්‍රමවලින් උද්දේශනය කළ හැකි විසඳුම් හඳුනාගන්නා පුද්ගලයෝ ය. එම ක්‍රියාකාරකම් අතර මහජන සන්නිවේදනය, සාමකාමී උද්ඝෝෂණ, පෙළපාලි, පිකටිං සහ ඇතැම් නිෂ්පාදන වර්ජනය ආදිය තිබේ. බොහෝ විට, ක්‍රියාධරයෝ වෙනත් සමාන අදහස් දරණ කණ්ඩායම් සමග සහයෝගයෙන් කටයුතු කරන අතර අවශ්‍ය විට (පාරදෘෂ්‍ය ලෙස) වෙනස ලබා ගත යුතු රජය හෝ සමාගම් සමග සාකච්ඡාවල යෙදේ.

එලදායී සක්‍රීය වීම සඳහා ඓතිහාසික උදාහරණයක් වන්නේ මහාත්මා ගාන්ධිගේ (1869 - 1948) ජීවිතයයි. එංගලන්තයේ නීතිඥයකු ලෙස උගත් ඔහු දකුණු අප්‍රිකාවේ දශක දෙකක් නීති වෘත්තිකයකු ලෙස කටයුතු කළේ ය. එහිදී ඔහු වාර්ගික හා ආර්ථික අයුක්තිය හා සම්බන්ධ සමාජ යුක්තිය සඳහා වන අරගල සමීපව ඇසුරු කළේ ය. 1914දී ආපසු ඉන්දියාවට පැමිණියේ වෙනස් ගාන්ධි කෙනෙකි. ඔහු පැමිණි වහා ම ඉන්දියාවේ නිදහස් ව්‍යාපාරයේ නායකයෙකු බවට පත් වූයේ ය.

ගාන්ධිගේ ක්‍රියාකාරිත්වයේ පදනම වූයේ අවිහිංසාවාදී සත්‍යග්‍රහ සහ නීතියට අවනත නොවීමේ පුරවැසි ව්‍යාපාරයි. ඔහුට අවිහිංසාවාදය යනු සරල ලෙස ශාරීරික ප්‍රචණ්ඩත්වයෙන් වැළකී සිටීම නොවේ. සෑම අයෙකු ම පාලන ක්‍රියාවලියට සම්බන්ධ විය යුතු ස්වයං පාලනය සහ රැඩිකල් ප්‍රජාතන්ත්‍රවාදය ද එහි වැදගත් අංග විය. මෙම අරමුණ වෙනුවෙන් කටයුතු කිරීමේදී ගාන්ධි දේශකයකු, ලේඛකයකු, ජනමාධ්‍යවේදියකු සහ සාමකාමී උද්ඝෝෂකයකු ලෙස කටයුතු කළේ ය. ඔහු තම පරමාදර්ශයන් පාවා නොදෙමින් බ්‍රිතාන්‍ය පාලකයන් සමග සාකච්ඡා කළේ ය.

වසර ගණනකට පසු, කණිෂ්ඨ මාටින් ලූතර් කිං (1929 - 1968) විසින් අප්‍රිකානු ඇමරිකානුවන්ට සුදු ඇමරිකානුවන් විසින් භුක්ති විඳින ලද ව්‍යවස්ථා සහ නීතිමය හිමිකම් දිනාගැනීමේ අරමුණින් දියත් කළ සිවිල් හිමිකම් ව්‍යාපාරයේදී ද සමාන අවිහිංසාවාදී ප්‍රතිරෝධය භාවිතා කරන ලදී. මාටින් ලූතර් කිං ගාන්ධි මුණගැසුණු අයෙකි.

වර්තමානයේ ක්‍රියාධරයන්ට සහ විරෝධතාවාදීන්ට ගාන්ධිගේ සහ කිංගේ දේශපාලන මූලෝපායන් වෙතින් වටිනා පාඩම් උකහාගත හැකි ය. ඔවුන් විසින් අනුගමනය කරන ලද සාමකාමී ප්‍රතිරෝධය අයුක්තිය පිළිබඳ දෘඪ සත්‍යයන් නිරාවරණය කිරීම සඳහා වඩා එලදායී විය.

# මහාත්මා ගාන්ධිගේ පාඩම්

මහාත්මා ගාන්ධි ජීවත් වූයේ අවිහිංසාවාදයේ පදනම් පහකට අනුව ය. ඒවා නම්, ගරුත්වය, අවබෝධය, පිළිගැනීම, ඇගයීම සහ අනුකම්පාවයි. “ගාන්ධි ද අප මෙන් ම වැරදි සහිත අයෙකු වූ මුත්, ඔහු මෙම කුළුණු මත ජීවිතය හැඩගස්වාගැනීමට උපරිම උත්සාහ කළේ ය ” යි ඔහුගේ මුණුබුරා වූ අරුන් ගාන්ධි 2015 දී **‘The Gift of Anger and Other Lessons from My Grandfather Mahatma Gandhi’** නම් පොතේ පැවසී ය.




Read more at: https://www.beliefnet.com/inspiration/the-lessons-of-mahatma-gandhi.aspx

## සක්‍රීය වීම සහ සන්නිවේදනය

සන්නිවේදන මෙවලම්වලින් හොඳින් ප්‍රයෝජන ගැනීම සක්‍රීය වීමේ මූලික ලක්ෂණයකි. තාක්ෂණය වැඩිදියුණු වන විට සක්‍රීය වීම සඳහා ඇති මෙවලම් වැඩි වේ.

සක්‍රීය වීම ආරම්භ වූයේ වෙනස හෝ සමාජ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් වූ මහජන දේශනවලිනි. මුද්‍රිත මාධ්‍ය භාවිතයට පැමිණීමෙන් පසු ඒ ඔස්සේ ක්‍රියාධරයන්ට ළඟා විය හැකි ප්‍රමාණය වැඩි විය. ස්ථාවරයන් සාරාංශගත කරන හා ක්‍රියාකාරිත්වය සඳහා කැඳවන පත්‍රිකා, පොත් පිංච ආදිය භාවිතය වර්ධනය විය.

පුවත්පත්, සඟරා, රේඩියෝ හා රූපවාහිනී වැනි විවිධ වර්ගවල ජනමාධ්‍ය භාවිතාවට පැමිණීමෙන් පසු, ක්‍රියාධරයන් තම පණිවුඩය වැඩි පිරිසක් වෙත සන්නිවේදනය කිරීම සඳහා එම මාධ්‍ය භාවිතා කිරීමට ක්‍රම සොයාගත් හ. කෙසේ වෙතත්, ජනමාධ්‍ය වෙත පිවිසීම බොහෝ විට ක්‍රියාධරයන්ට අභියෝගාත්මක කාර්යයක් විය. එයට හේතුව, මාධ්‍ය සමාගම් පාලනය කරනු ලබන්නේ රාජ්‍ය හෝ සමාගම් හිමිකරුවන් (එසේම සංස්කාරකවරුන්) විසින් වීමයි. ඉඩ දිය යුත්තේ කුමන පණිවුඩයට ද යන්න සහ එය කරන්නේ කෙසේ ද යන්න තීරණය කරන්නේ ඔවුන් ය.

ඩිජිටල් සහ වෙබ් මෙවලම් යනු ක්‍රියාධරයන්ගේ මෙවලම් කට්ටලයට අලුතෙන් ම එකතු වූ අංගයි. අන්තර්ජාල ප්‍රවේශය ඇති ඕනෑම පුද්ගලයකුට හිමිකරුවන්ගේ සහ සංස්කාරකවරුන්ගේ මාධ්‍ය 'දොරටුපාලකයන්' මඟහැර යමින් ස්වයංව ප්‍රකාශනයේ යෙදීමේ හැකියාව එමගින් ලබා දෙයි. මෙම විභවය අවබෝධ කරගෙන අත්පත් කරගැනීමට ක්‍රියාධරයෝ සහ ප්‍රතිසංස්කරණවාදීහු වහා කටයුතු කළ හ.

වෙබ් යනු ඓන්ද්‍රියව ම අන්තර් ක්‍රියාකාරී පරිසරයකි. එය සියලු ක්‍රියාධරයන් විසින් වටහා ගත යුතු කරුණකි. එයින් අදහස් වන්නේ ද්වි විධ සන්නිවේදනයක යෙදීමයි. ඒ අනුව අතථ්‍ය ප්‍රජාවන් සමග නිරන්තරයෙන් සම්බන්ධ වෙමින් මහජන සංවාදයක යෙදිය යුතු ය. එම ප්‍රජාවන අතර අවධානය වෙනතක හරවන පුද්ගලයින් සහ විචාරකයන් ද සිටිය හැකි ය.



[1] What Gandhi can teach today's protesters. The Conversation, 2 October 2017. http://theconversation.com/what-gandhi-can-teach-todays-protesters-83404

## අන්තර්ජාලයේ සක්‍රීය වීම

ඩිජිටල් සහ අන්තර්ජාල සක්‍රීය වීමට, විවිධ වෙබ් භාවිතා කරමින් සිදුකරන ක්‍රියාමාලාවල, අලෙවිකරණයේ සහ ප්‍රජාවන් ගොඩනැගීමේ ක්‍රියාකාරකම් සම්මිශ්‍රණයක් අයත් වේ. ඇතැම් විට එය ආපදා සහන වැනි විශේෂ හේතූ වෙනුවෙන් මහජන පරිත්‍යාග භාරගැනීම දක්වා පුළුල් වේ.

1990 දශකයේ වෙබ්වල මුල් වකවානුවේ දී, ක්‍රියාධරයන් වැඩියෙන් නව මාධ්‍ය භාවිතා කළේ තොරතුරු සහ උද්දේශන ස්ථාවරයන් ප්‍රචාරය කිරීමටයි. වෙබ් සහ පසු කලෙකදී බ්ලොග් විසින් ඔවුන්ට අඩු වියදමකින් ගෝලීය ග්‍රාහකත්වයක් ලබාගැනීමේ හැකියාව ලැබිණි.

2000 දශකයේදී සමාජ මාධ්‍ය බිහි වීමත් සමඟම ඩිජිටල් ක්‍රිසකක්‍රීය වීම වඩා අන්තර් ක්‍රියාකාරී සහ සංකීර්ණ විය. විවිධාකාරයෙන් මහජනයා බලමුළුගැන්වීම කළ හැකි විය. ඒ ක්‍රියාමාලා සහ විරෝධතා ආදිය ඔස්සේ ය.

ප්‍රධාන ධාරාවේ මාධ්‍ය තවදුරටත් සමාජයේ කොටසක් වෙත ප්‍රවේශය ඇති වැදගත් මාධ්‍ය වන අතර ම, වර්තමානයේදී වැඩි වැඩියෙන් සක්‍රීය වීම් සිදුවන්නේ අන්තර්ජාලය ඔස්සේ ය.

පාඨකයන් වෙත ළඟාවීමෙන් සහ බලමුළුගැන්වීමෙන් ඔබ්බට, ඩිජිටල් මෙවලම් සහ වෙබ් විසින් කාලය සහ අවකාශය අතර පැතිරෙමින් බෙදාහදාගත් ගෝලීය ප්‍රශ්න සම්බන්ධයෙන් ක්‍රියාමාලා සැලසුම් කිරීමේ හා සංවිධානය කිරීමේ හැකියාව ක්‍රියාධරයන්ට සපයනු ලැබේ.

ගෝලීය පරිමාණයෙන් #BlackLivesMatter, #MeToo සහ #ClimateStrike වැනි ක්‍රියාමාලා වැඩිපුර ම දියත් වූයේ සමාජ මාධ්‍ය ඔස්සේ ය. එහෙත්, කැපී පෙනෙන තරම් ක්‍රියාවන් ප්‍රමාණයක් සිදුවන්නේ භෞතික ක්‍රියාකාරකම් ඔස්සේ ය. ඒවා වනාහි වීදි පෙළපාලි සහ මහජන රැස්වීම් ආදියයි.

දුසිම් ගණනක් වූ මෑත කාලීන සමාජ සහ දේශපාලන සක්‍රීය වීමේ ප්‍රයත්නවලින් උගත හැකි ප්‍රධාන කරුණක් වන්නේ සාර්ථකත්වය රඳාපවතින්නේ අන්තර්ජාල සහ භෞතික ක්‍රියාවන්ගේ යහපත් සම්මිශ්‍රණයක බවයි. සාමකාමී වීදි උද්ඝෝෂණ, පෙළපාලි සහ පොදු අවකාශවල ක්‍රියාත්මක වීම තවමත් අදාළ ය. එමඟින් සමාජ මාධ්‍ය සහ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය සඳහා ඡායාරූපමය අවස්ථා රැසක් නිර්මාණය වේ.

සමාජ මාධ්‍ය භාවිතා කරන ක්‍රියාධරයන්ට තිබෙන ප්‍රධාන ම අභියෝගය වන්නේ මහජන රුචිකත්වය කාලයත් සමග රැකගැනීමයි. අන්තර්ජාල රුචිකත්වය වේගයෙන් ගොඩනැගිය හැකිවා සේ ම එය එපමණ ම වේගයෙන් අඩු වී යා හැකි ය. දවස පුරා අලුත් ප්‍රවෘත්ති එළිදකින විට සහ විවිධ මාතෘකා විසින් මිනිසුන්ගේ අවධානය පැහැරගන්නා විට එක් ප්‍රශ්නයක් හෝ අරමුණක් සමග රැඳී සිටීම අපහසු ය.

අවසානයේ දී, ඩිජිටල් සක්‍රීය වීම යනු තාක්ෂණය භාවිතා කිරීමට වඩා වැඩි දෙයක් බව මතක තබාගැනීම වැදගත් ය. ඩිජිටල් ක්‍රි සක්‍රීය වීමේ සංදර්භය ක්‍රියාමාලාවලදී භාවිතා කරනු ලබන ඩිජිටල් තාක්ෂණයට සහ එම තාක්ෂණයන් භාවිතා වන ආර්ථික, සමාජ සහ දේශපාලන සංදර්භය යන දෙකට ම අදාළ ය.

ඩිජිටල් තාක්ෂණ යටිතලය, එනම්, ජාල පද්ධති, කේත, යෙදවුම් සහ උපාංග, යනු ආරම්භක ස්ථානයක් පමණි. කොපමණ ක්‍රියාධරයන් පිරිසකට ඩිජිටල් මෙවලම් පොදු අරමුණක් වෙනුවෙන් භාවිතා කිරීමෙන් සාර්ථක විය හැකි ද යන්න තීරණය වන්නේ එක් එක් රටවල ආර්ථික, සමාජ සහ දේශපාලනික තත්වයන් විසිනි. එබැවින්, වැදගත් පළමු පියවරක් වන්නේ, ඔබගේ සමාජ සහ දේශපාලනික යථාර්ථයන් අවබෝධ කරගැනීමයි.



## අන්තර්ජාලයේ සක්‍රීය වීම්:
## මෑතකාලීන උදාහරණ

**#BlackLivesMatter** යනු අප්‍රිකා ඇමරිකා ප්‍රජාව අතරින් මතු වූ ජාත්‍යන්තර ක්‍රියාධර ව්‍යාපාරයකි. එය ක්‍රියාමාලාවල යෙදුණේ විශේෂයෙන් ම එක්සත් ජනපදයේ කළු ජනතාවට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහිවයි. 2013 දී එය ආරම්භ වූයේ බොහෝ පොලිස් ප්‍රචණ්ඩත්වයන් සහ වෙනස්කම් කිරීම්වලට පසුවයි.

**#ClimateStrike** යනු පාසල් සිසුන්ගේ ජාත්‍යන්තර ව්‍යාපාරයකි. ඔවුන් විසින් තවදුරටත් මිහිතලය උණුසුම් වීම හා කාලගුණ විපර්යාස වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ඉල්ලා සිටිමින් අධ්‍යාපනයෙන් ඉවත් වීම ආරම්භ කරන ලදී. ස්වීඩනයේ පාසල් ශිෂ්‍යාවක් වන ග්‍රේටා තන්බර්ග් විසින් ස්වීඩන පාර්ලිමේන්තුව ඉදිරිපිට 2018 අගෝස්තුවේදී පවත්වන ලද විරෝධතාවකින් එය ආරම්භ විය. තරුණයන් සහ විවිධ වයස් කාණ්ඩවල පුද්ගලයන් සම්බන්ධ කරගනිමින් එය ඉන්පසු ලොව පුරා පැතිරිණි.

**#MeToo** යනු ලිංගික හිංසනයට හා ප්‍රහාරවලට එරෙහි ලෝක ව්‍යාප්ත ව්‍යාපාරයකි. 2017 දී මෙම ව්‍යාපාරය හෑෂ්ටැගයක් භාවිතයෙන් ලොව පුරා ම වේගයෙන් පැතිරිණි. (විස්තර සඳහා සිද්ධි අධ්‍යයනය - 5 බලන්න)

## අන්තර්ජාල සක්‍රීය වීමේ මූලෝපාය

සාර්ථක අන්තර්ජාල ක්‍රියාමාලාකරුවන් විසින් තම උද්දේශනය සහ සක්‍රීය වීම පවත්වාගැනීම සඳහා නිර්මාණාත්මක මූලෝපායන් භාවිතා කරනු ලැබේ. පහත දැක්වෙන්නේ උදාහරණ තුනකි.


### HASHTAGS
### හෑෂ්ටැග

හෑෂ්ටැගයක් යනු වෙනත් අයට නිශ්චිත තේමාවක හෝ අන්තර්ගතයක පණිවුඩ තෝරාගැනීම පහසු කිරීම සඳහා ට්විටර්, ඉන්ස්ටග්‍රෑම්, ෆේස්බුක්, රෙඩ්ඩිට් සහ යූටියුබ් වැනි බොහෝ සමාජ මාධ්‍ය  විසින් භාවිතා කරනු ලබන පොදු වර්ගීකරණ උපාංගයකි.

යහපත් හෑෂ්ටැගයක් කෙටි, සිත් ඇදගන්නා, මතක තබාගත හැකි සහ කැපී පෙනෙන එකක් විය යුතු ය. (ඔබ යෝජනා කරන හෑෂ්ටැගය දැනටමත් වෙනත් කණ්ඩායමක් විසින්, වෙනත් තැනක භාවිතා කරමින් තිබේ ද යන්න සොයා දැනගැනීම වැදගත් ය.)

ශ්‍රී ලංකාව ඇඟවීම සඳහා #lk, #lka, #sl සහ #SriLanka යන හෑෂ්ටැගයන් පුළුල්ව භාවිතා වේ. මෑත වකවානුවේදී භාවිතා වූ පොදු හෑෂ්ටැගයන් වන්නේ #FloodSL, #FloodLK සහ #SLFloods ආදියයි. ඒවා භාවිතා කරනු ලැබුවේ මහා ගංවතුර සිදුවීම්වලින් පසු පීඩාවට පත් වූවන් බේරාගැනීමට සහ සහන සැලසීමට ඉදිරිපත් වූ ස්වේච්ඡා පුරවැසියන් විසිනි. #PresPollSL යනු 2015 ජනාධිපතිවරණය වෙනුවෙන් භාවිතා කරන ලද හෑෂ්ටැගයයි. 2019 ජනාධිපතිවරණයේදී එය යළි භාවිතාවට පැමිණ තිබේ. #CoupLK (බලය හුවමාරු කරගත් ආකාරය නීති විරෝධී බව අඟවන), #ConstitutionalCrisisLK සහ #PoliticalCrisisLK වැනි හෑෂ්ටැග් 2018 ඔක්තෝබර් 26 දින සිට දෙසැම්බර් 19 දා දක්වා ක්‍රියාත්මක වූ දින 51 කුමන්ත්‍රණයේ දී භාවිතා විය.

ඕනෑම කෙනෙකුට අලුත් හෑෂ්ටැගයක් ජනනය කළ හැකි ය. එහෙත්, ජනප්‍රිය වන්නේ හෑෂ්ටැග් කීපයක් පමණි. බොහෝ අය විසින් භාවිතා කරනු ලැබීම එයට හේතුවයි. හෑෂ්ටැග් පැනනගින්නේ සමාජ මාධ්‍ය පරිශීලකයන් අතරිනි. ඩිජිටල් ක්‍රියාධරයෝ එම සරල උපාංගය තම විවිධ ප්‍රකාශන සහ පණිවුඩ වෙනුවෙන් භාවිතා කරන ආකාරය උගනිමින් සිටිති.



## MEMES
## මීම්

වෙබ් මීම් එකක් යනු නිශ්චල රූපයක්, සක්‍රිය කරන ලද රූපයක් හෝ වීඩියෝවක් විය හැකි ය. එහි අරමුණ වන්නේ යම් අදහසක් අනුකරණය, හාස්‍යය හෝ උපහාසය භාවිතා කරමින් සන්නිවේදනය කිරීමයි. වෙබ් මීම් නිර්මාණකරුවා බොහෝ විට නිර්නාමික ය. සමාජ මාධ්‍යවල පුළුල්ව බෙදාගැනීම ඔස්සේ ඇතැම් මීම් වේගයෙන් පැතිරී යයි.

මීම් රළු සහ අපිළිවෙල විය හැකි ය. නැතිනම් කලා කෘති හෝ සංකීර්ණ ග්‍රැෆික් නිර්මාණ විය හැකි ය. ඉදිරිපත් කිරීමට වඩා වැදගත් වන්නේ පණිවුඩය සහ එය ඉදිරිපත් කර තිබෙන දක්ෂභාවය යි.

මීම් පැනනැගුණේ ජනප්‍රිය සංස්කෘතිය තුළිනි. එහෙත්, සමාජ සහ දේශපාලනික ක්‍රියාකාරිකයන් විසින් මහජන රුචිකත්ව සන්නිවේදනය විෂයෙහි එහි තිබෙන විභවය හඳුනාගන්නා ලදී. ස්ත්‍රී පුරුෂ සමාජභාවී බලසතු කිරීමේ සහ දූෂණ විරෝධී ක්‍රියාකාරකම්වල සිට පිරිසිදු මැතිවරණ සහ පාරිසරික ක්‍රියාකාරිත්වයන් දක්වා ඩිජිටල් ක්‍රියාමාලාවලදී මීම් විසින් නිර්මාණාත්මක හා කාලීන කාර්යභාරයක් කරනු ලැබේ.

මීම් සඳහා කදිම උදාහරණයක් වන්නේ 'ජාතිවාදයට එරෙහිව නැඟීසිටින්නී යන පණිවුඩය රැගත් අත්ලක රූපය ඇති මීම් එකයි. එය මුලින් පැනනැගුණේ 2014 ජුනි අලුත්ගම මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය අතරතුර ය. එහි නිර්මාණකරුවා කවුරුදැයි  කිසිවෙකු දන්නේ නැත. එහෙත්, එමඟින් ඇති කරන ලද හැඟීම සාම ලැදි බහුතර ශ්‍රී ලාංකිකයන් විසින් ග්‍රහණය කරගන්නා ලදී. වාර්ගික සමඟිය සහ පීඩාවට පත් වූවන් සමග සහකම්පනය සහ සංයමය ප්‍රකාශ කිරීම සඳහා එය පුළුල් ලෙස බෙදාගන්නා ලදී.



## අන්තර්ජාල පෙත්සම්

අන්තර්ජාල පෙත්සම් යනු ක්‍රියාධරයන් සතු තවත් මෙවලමකි. ඔවුන් ජීවත් වන්නේ මහජන මතයේ වටිනාකමට ගරු කරන රජයේ නිලධාරීන් සහ සමාගම් පවතින රටක නම් ඔවුන්ට එය ඉතා වැදගත් ය.

අන්තර්ජාල පෙත්සමක් වෙත පැමිණෙන පිරිස් එම පෙත්සමට තම නම ඊමේල් ලිපිනය භාවිතා කරමින් අත්සන් කරනු ලැබේ. සාමාන්‍යයෙන්, පෙත්සමකට ප්‍රමාණවත් තරම් අත්සන් සංඛ්‍යාවක් එකතු වූ පසු එය පෙත්සම අදාළ අධිකාරීන් වෙත භාර දෙනු ලැබේ. ඒ දේශපාලන නායකයකු, රජයේ නිලධාරියකු හෝ සමාගමක් විය හැකි ය.

බොහෝ පෙත්සම් වෙබ් අඩවි විසින් පුද්ගලයන්ට ලියාපදිංචි වී තමන්ගේ ම අලුත් පෙත්සම් ආරම්භ කිරීමට ද අවස්ථාව ලබා දෙයි. අන්තර්ජාල පෙත්සම් අවස්ථා සහිත Change.org, Avaaz.org සහ iPetitions.com වැනි වෙබ් අඩවි ගණනාවක් තිබේ. Avaaz යනු එක්සත් ජනපදය පාදක කරගත් ලාභ නොලබන සංවිධානයක් විසින් 2007දී ආරම්භ කරන ලද, දේශගුණික විපර්යාස, මානව හිමිකම්, දූෂණය, දිළිඳුකම සහ ගැටුම් ආදිය සම්බන්ධ ගෝලීය සක්‍රීය වීම් ප්‍රවර්ධනය කරන අවකාශයකි.

## දත්ත දෘෂ්‍යකරණය

ප්‍රශ්න හෝ අරමුණු වෙනුවෙන් උද්දේශනයේදී ප්‍රශ්න සම්බන්ධ දත්ත මැනැවින් විශ්ලේෂණය කරන සක්‍රීය වීම් වඩා ඵලදායී ය. කෙසේ වෙතත්, බොහෝ අයට සංඛ්‍යා පහසුවෙන් තේරුම් ගත හැකි පරිදි ඉදිරිපත් කිරීම පහසු නැත. දත්ත දෘෂ්‍යකරණය යනු තොරතුරු සහ දත්ත රූපමය ලෙස ඉදිරිපත් කිරීමයි. ඒ වෙනුවෙන් රූප සටහන්, ප්‍රස්ථාර, සිතියම් වැනි දත්ත දෘෂ්‍යකරණය කරන ලද මෙවලම් භාවිතා කළ හැකි ය. එමඟින් ප්‍රවණතා, බාහිර සාධක සහ රටා ආදිය පහසුවෙන් තේරුම්ගත හැකි ය. ප්‍රබල ඉන්ෆොග්‍රැෆික් (infographic) වලට ක්‍රියාමාලා සජීවී ලෙස වැඩි පිරිසක් වෙත රැගෙන යා හැකි ය.

වියළි වාර්තා සහ දත්ත පදනම්, මානවයන් නියෝජනය වන පරිදි පරිවර්තනය කිරීම දත්ත දෘෂ්‍යකරණයේ ප්‍රධාන අරමුණයි. එය හරිහැටි කළ විට, එමඟින් දත්ත තුළ ගැබ්ව ඇති අරුත් මතු කරනවා පමණක් නොව අවධානයට ලක්වන ප්‍රශ්නය මානුෂීයකරණය ද සිදු වේ.

“අප එයට යට වී සිටියත්, එය නොමැතිව හාමත්ව සිටියත්, තොරතුරුවල වටිනාකම රඳාපවතින්නේ එහි ගුණය මතයි. එහි ප්‍රයෝජනවත්කම රඳා පවතින්නේ එය සාර්ථක ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව මතයි. ක්‍රියාධරයින් ලෙස අපට මිනිසුන් පිටු 60ක වාර්තාවක් කියවා හමාර කරන තෙක් බලා ඉන්නට බැහැ. මිනිසුන්ට බලපෑම් කිරීම සඳහා අප ශක්තිමත් තර්ක ගොඩනැගිය යුතුයි. ඒවා ශක්තිමත් සාක්ෂි සමග සන්නිවේදනය කළ යුතුයි. නිසි කලට, ප්‍රාණවත් ලෙස තොරතුරු හොඳින් ඉදිරිපත් කිරීම තමයි ක්‍රියාධරයන්ගේ ලොකුම සම්පත.”

උද්දේශනය සඳහා තොරතුරු දෘෂ්‍යකරණය කිරීම,,**2013**
**BOOK BY TACTICAL TECHNOLOGY COLLECTIVE**

## ශ්‍රී ලංකාවේ ඩිජිටල් ක්‍රියාවාදය

ශ්‍රී ලංකාවට සමාජ, දේශපාලනික සහ පාරිසරික ක්‍රියාවාදයන් සම්බන්ධයෙන් දශක ගණනක ඉතිහාසයක් තිබේ. මෑත කාලයේදී, දේශපාලන ප්‍රතිසංස්කරණවල සහ සමාජ යුක්තියේ සිට සත්ව සුබසාධනය සහ මහජන සෞඛ්‍යය දක්වා විවිධ ප්‍රශ්න ගැන සංවේදී පුද්ගලයන් සහ කණ්ඩායම් විසින් වෙබ් අඩවි, බ්ලොග්, අන්තර්ජාල පෙත්සම්, සමාජ මාධ්‍ය සහ වෙනත් ඩිජිටල් මෙවලම් භාවිතා කිරීම ආරම්භ කර තිබේ.

ෆ්‍රීඩම් හවුස් නම් එක්සත් ජනපදය පාදක කරගෙන ක්‍රියාත්මක වන, පර්යේෂණ සහ උද්දේශන කණ්ඩායම විසින් සකසනු ලබන ශ්‍රී ලංකාවේ අන්තර්ජාල නිදහස පිළිබඳ 2018 වාර්තාවේ දැක්වෙන පරිදි, “රළු ඩිජිටල් සක්‍රීය වීමක් සහ ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කිරීමේ මාවත් වෙබ් විසින් සපයා තිබේ. එහෙත්, බොහෝ ක්‍රියාමාලාවන්ගේ ආරම්භය සහ ප්‍රගතිය සමග එය සම්බන්ධයි. බොහෝ ඒවා කෙටිකාලීන සිදුවීම්, අර්බුද හෝ එකතැන පල්වෙන දේශපාලන ක්‍රියාවලි සමඟ සම්බන්ධ යි. අරුත්බර වෙනස්කම් සහ දිගුකාලීන සහභාගිත්වය ගොඩනගාගැනීමට අවශ්‍ය තත්වය ඇති කරගැනීමට ක්‍රියාමාලාකරුවන්ට සාමාන්‍යයෙන් හැකියාව නැහැ. කෙසේ වෙතත්, 2017-18 වාර්තාවට අදාළ කාලය තුළදී බොහෝ මාධ්‍ය ක්‍රියාමාලා සිදු විය.”

ශ්‍රී ලංකාවේ ඩිජිටල් ක්‍රියාවාදය සංවිධානය කරනු ලැබුවේ බෙදාහදාගත් හෑෂ්ටැගයන් මෙන් ම ජනප්‍රිය සටන් පාඨ ද ඔස්සේ ය. පහත දැක්වෙන්නේ බොහෝ උදාහරණ අතරින් කීපයකි:

- **#IVotedSL** අන්තර්ජාල ක්‍රියාමාලාව ආරම්භ කරනු ලැබුවේ පුරවැසියන්ට ප්‍රධාන මැතිවරණ දෙකකදී ඡන්දය ප්‍රකාශ කරන ලෙස දිරිගැන්වීමට ය. එම මැතිවරණ දෙක නම් 2015 ජනවාරි ජනාධිපතිවරණය සහ 2015 අගෝස්තු පාර්ලිමේන්තු මැතිවරණයයි. 2018 පෙබරවාරි පළාත් පාලන මැතිවරණය සමග **#LGPollSL** හෑෂ්ටැගය සහිත ක්‍රියාමාලාව දියත් විය. මෙම ක්‍රියාමාලාවලදී පළමු වරට ඡන්දය ප්‍රකාශ කළ බොහෝ අය තමන් ඡන්දය ප්‍රකාශ කළ බව පැවසීමට තීන්ත ගෑ ඇඟිල්ල ප්‍රදර්ශනය කරන ඡායාරූප ප්‍රසිද්ධ කළ හ.

- 2016 ජුනි මස තොරතුරු දැනගැනීමේ හිමිකම් පනත පාර්ලිමේන්තුවේ සම්මත වූ විට, එමගින් 1994 දී ආරම්භ වූ උද්දේශන ව්‍යාපාරය කූටප්‍රාප්තියට පත් විය. ඒ සම්බන්ධ උද්දේශනයන් වැඩි ප්‍රමාණයක් සිදු වූයේ භෞතික සමාජයේ ය. එහෙත්, නීතිය යථාර්ථයක් වූ විට, ක්‍රියාධරයන් විසින් ප්‍රධාන ධාරාවේ සහ සමාජ මාධ්‍ය භාවිතා කරමින් එම අලුත් හිමිකම පිළිබඳ දැනුවත් කිරීම් හා පුරවැසියන්ට එම හිමිකම භාවිතා කිරීමට දිරි දීම සිදු කළ හ. එහිදී භාවිතා වූ පොදු හෑෂ්ටැගය වන්නේ **#RTIsl** ය.

- මානව හිමිකම් ක්‍රියාධරයන් සහ සිවිල් සමාජ කණ්ඩායම් විසින් #DisappearedSL භාවිතා කරනු ලැබුවේ, උතුරු නැගෙනහිර අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් විසින් යුක්තිය ඉල්ලා පවත්වන ලද විරෝධතාවලට සහයෝගය ලබාදීම හා ඒවා වාර්තා කිරීම වෙනුවෙනි. ඒ වෙනුවෙන් භාවිතා කරන #StillNoAnswers වන අතර, එය ඇම්නෙස්ටි ජාත්‍යන්තරය විසින් පවා භාවිතා කරන ලදී.

- ජනවාර්ගික සහ වාර්ගික සංහිඳියාව අන්තර්ජාලයේ මෙන් ම භෞතික සමාජයේ ද ක්‍රියාවාදයේ මූලික පදනමකි. එමගින් ජාතිය හා ආගම මත පදනම්ව ජාතිවාදය හා වෙනස්කම් කිරීම හෙළාදැකීම සඳහා පුද්ගලයන් සහ කණ්ඩායම් ඒකරාශී කෙරිණි.

- පොදු ප්‍රවාහනයේ සහ සේවා ස්ථානයේ ලිංගික හිංසනය බරපතල ප්‍රශ්න බව දත්ත මඟින් හෙළිදරව් වී තිබෙන නිසා, ඒවා වැළැක්වීම සඳහා දැනුවත් කිරීම හා උද්දේශනය කිරීම සඳහා භෞතික සමාජයේ සහ අන්තර්ජාලයේ සිදු කරන ලද ක්‍රියාමාලාවලදී එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල විසින් සිය පාර්ශ්වකරුවන් සමග #DoesSheTravelSafe ක්‍රියාමාලාව දියත් කරන ලදී. 2019දී ඔක්ස්ෆෑම් සහ තවත් පාර්ශ්වකරුවන් විසින් #NotOnMyBus සහ #CreateAScene සමාජ මාධ්‍ය ක්‍රියාමාලා දියත් කරමින් අසල සිටින්නන්ට කාන්තාවන්ට හා ගැහැණු ළමයින් එරෙහිව සිදු වන හිංසනයේදී මැදිහත් වන ලෙස බලපෑම් කරන ලදී.

ඩිජිටල් ක්‍රියාකාරිත්වයන්ගේ සෑම ප්‍රයත්නයක් ම සාර්ථක වන්නේ නැත. උදාහරණයක් ලෙස, #NewConstSL මගින් උත්සාහ කරනු ලැබුවේ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡාව ඉදිරියට ගෙන යාමට යි. එහෙත්, මහජනතාව අතර ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳ එතරම් උනන්දුවක් ඇතිකිරීමට එය සමත් වූයේ නැත.

ඇතැම් විට, ක්‍රියාධරයන්ට ඩිජිටල් වශයෙන් වෙනත් අයෙකුගේ පාර්ශ්වය මත කඩාවැදී පවා යම් කරුණක් කෙරෙහි අවධානය යොමු කළ හැකි ය. උදාහරණයක් ලෙස, 2017-18 සමයේදී ග්‍රවුන්ඩ්වීව්ස්, විකල්ප සහ මාතෘම් පුරවැසි වෙබ් විසින් ශ්‍රී ලංකාවේ තේවල වසර 150ක ඉතිහාසය මතු කර දක්වමින් උඩරට දෙමළ ප්‍රජාවේ දෛවය පෙන්වා දෙන ලදී. මෙම ප්‍රජාව ජනගහනයේ වඩාත් ම පීඩිත කොටසකි. (කෙසේ වෙතත්, එය දෙපැත්තට ම ක්‍රියාත්මක විය හැකි ය. ක්‍රියාධරයන් විසින් ජනනය කරනු ලබන හෑෂ්ටැගයන් ඇතැම් විට එම උද්දේශන ස්ථාවරයන්ට එරෙහි අය විසින් පැහැරගැනීමට ලක් වීමට ඉඩ තිබේ.)

මේ පිළිබඳ තවත් ලාංකික උදාහරණ පහත දැක්වෙන සිද්ධි අධ්‍යයනවලදී හමු වේ.



## ඩිජිටල් සක්‍රීය වීම (DIGITAL ACTIVISM) පිළිබඳ විවේචන

ඩිජිටල් සක්‍රීය වීම පිළිබඳ යම් විවේචන තිබේ. ඒ තර්ක සටහන් කර තැබීම වටියි.

සමාජ මාධ්‍යය තුළ ඇති 'ක්ලික්ටිවිස්මී (clicktivism) විසින් සහකම්පනයට වඩා නිශේධනීය අදහස් ඇති කරන බවට අදහසක් ඇත. සැබෑ සමාජ වෙනස යනු දේශපාලන පළකිරීම් හුදු ලයික් කිරීමට හෝ ෂෙයා කිරීමට වැඩි දෙයක් බව ඔවුහු පෙන්වා දෙති. එක් විවේචකයකු පවසන පරිදි මෙමඟින් එක් ක්ලික් කිරීමකින් අයුතු ජනරාශියක් කුලියට ගැනීම සිදු වේ. අව්‍යාජ දේශපාලන සංවාදයට සහ අන්තර්ක්‍රියාකාරිත්වයට වඩා තොරතුරු මත පදනම් නොවුණු අසම්බන්ධිත ක්ෂණික විද්‍යුත් සන්නිවේදනයක් ඇති වේ. තවත් විචාරකයකු විසින් පෙන්වා දෙන ලද පරිදි සමාජ මාධ්‍යවල දී ප්‍රශ්න සම්බන්ධයෙන් ක්ලික් කිරීම පහසු ය. එසේම, අන්තර්ජාලය ඔස්සේ සම්බන්ධතා බිඳගැනීම ද ලෙහෙසි ය. අන්තර්ජාල පෙත්සම් විසින් සංකීර්ණ සහ ආචාරධාර්මික ප්‍රශ්න අති සරල කර දැමිය හැකි බවට ද විවේචනයක් තිබේ.

ප්‍රතිඋත්තර දෙමින් ඩිජිටල් ක්‍රියාධරයන් පවසන්නේ වෙබ් සහ සමාජ මාධ්‍ය යනු ක්‍රියාධරයන් විසින් භාවිතා කරනු ලබන අමතර මෙවලම් මිස ඔවුන් ඒවාට පමණක් සීමා නොවන බවයි. ඔව්, ඒවා අසම්පූර්ණ මෙවලම් ය. හොඳම ප්‍රතිඵල ලබාගත හැක්කේ ඒවා යෝග්‍ය හා කල්පනාකාරී ලෙස යොදාගැනීමෙනි.

එක්සත් ජනපදයේ ඇතැම් දත්ත විශ්ලේෂණ විසින් පෙන්වා දී තිබෙන පරිදි ස්වේච්ඡාවෙන් වැඩ කිරීමට පෙළඹීමේ ප්‍රවණතාවට වඩා 'ක්ලික්ටිවිස්මී (clicktivism) මඟින් දායක වීමේ ප්‍රවණතාවය දෙගුණයකින් වැඩි ය. පරිත්‍යාග ඉල්ලා සිටීමේ ප්‍රවණතාව දෙගුණයකින් වැඩි ය. අවස්ථාවකට සහභාගි වීමේ හැකියාව දෙගුණයකින් වැඩි ය. වෙනත් අයට සහභාගි වන්නැයි දිරිගැන්වීමේ හැකියාව සිව්ගුණයකින් වැඩි ය.

අන්තර්ජාලය එක්තරා සමාජයක් විසින් පමණක් භාවිතා කරනු ලබන රටක් වන ශ්‍රී ලංකාවේ අපට සක්‍රීය වීම අන්තර්ජාලයේත්, භෞතික සමාජයේත් ක්‍රියාවල සම්මිශ්‍රණයක් විය යුතු ය.

## ඩිජිටල් සක්‍රීය වීමේ ආචාරධර්ම

අන්තර්ජාලයේ මෙන් ම භෞතික ලෝකයේ ද සක්‍රීය වීම සිදු විය යුත්තේ වගවීමක් සහිතව ය. පාරදෘෂ්‍ය හා ආචාරධාර්මික රාමුවක් තුළ ය. යහපත් අභිප්‍රායන් තිබුණු පමණින් සැක උපදවන සහ ආත්මාර්ථකාමී අරමුණු සහිත භාවිතාවන් සාධාරණීකරණය වන්නේ නැත.

උදාහරණයක් ලෙස, ඇතැම් අන්තර්ජාල පෙත්සම් පුද්ගලයන්ගේ ඊමේල් ලිපින ලබාගැනීමේ මාර්ගයක් බව හෙළිදරව් වී තිබේ. මෙම ඊමේල් ලිපින පසුව ඩිජිටල් අලෙවිකරණ සමාගම් විසින් ලාභලැබීමේ අරමුණු වෙනුවෙන් භාවිතා කරනු ලැබේ. ඇතැම් අන්තර්ජාල හරහා ආධාර රැස්කරන්නන් විසින් ඔවුන් සම්මාදම් කරන අරමුදල්වලින් වැඩි ප්‍රමාණයක් පුණ්‍යායතනවල නඩත්තු වියදම් සඳහා යොදාගනු ලැබේ.

සමාජ ක්‍රියාධරයන්ට තමන්ගේ දේශපාලන දැක්ම හා දේශපාලන පක්ෂ හිතවත්කම් පැවතිය හැකි ය. කෙසේ වෙතත්, පොදු වැදගත්කමක් තිබෙන උද්දේශනයන්හි දී සහ සක්‍රීය වීම්වල දී වඩා හොඳ වන්නේ දේශපාලන බෙදීම්වලින් තොරව කටයුතු කිරීමයි. දේශපාලන පක්ෂ විසින් සමාජ සක්‍රීය වීම්වලට බලපෑම් කිරීම හෝ එවැනි ක්‍රියාමාලා තම අරමුණු වෙනුවෙන් පාවිච්චි කිරීම ආචාරධාර්මික නැත. ඒ හා සමානව ම පොදු අරමුණක් වෙනුවෙන් උද්දේශනය කිරීම හේතුවෙන් යම් ක්‍රියාධරයකු සමාජ මාධ්‍යවල දී වෛරී සහ තර්ජනාත්මක භාෂා භාවිතා කිරීම සාධාරණීකරණය වන්නේ නැත.

> "අන්තර්ජාන ක්‍රියාධරයන් කතිකාවේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා වැඩ කළ යුතු ය. එසේ කරනු ලබන්නේ පුරුදු සංවර්ධනය කරගැනීමෙන් සහ ඒවා වඩා ආචාරධාර්මික බවට පත් කරන ප්‍රමිති යටතේ මෙයෙවීමෙනි. ප්‍රචණ්ඩත්වය ඉල්ලා සිටීමෙන් හෝ 'සමාජ මාධ්‍ය යුද්ධවලී යෙදීමෙන් යහපත කිරීමේ අරමුණෝ දැක්ම අහිමි වීම උද්දේශනය සිදු කරනු ලබන ප්‍රශ්නය හෝ අරමුණ සම්බන්ධයෙන් ප්‍රශ්නකාරී විය හැකි ය."
>
> ෆෝඩ්හැම් විශ්වවිද්‍යාලයෙ
> **ETHICS AND SOCIETY** බ්ලොග් අඩවිය

## සක්‍රීය වීම අඛණ්ඩතාවක් ලෙස

අවසාන වශයෙන්, අප මතක තබාගත යුතු කරුණක් වන්නේ ක්‍රියාධරයකුගේ කාර්යභාරය කිසි දිනෙක අවසන් නොවන බවයි. හැමවිට ම, තවත් කළ යුතු දේ තිබේ. සක්‍රීය වීම සඳහා අප්‍රතිහත ධෛර්යය, අරමුණ වෙනුවෙන් නොසැලී සිටීමේ ගුණය සහ දිගුකාලීන දැක්ම  අවශ්‍ය ය.

මානව හිමිකම්, සමාජ යුක්තිය හෝ පාරිසරික සංරක්ෂණය වෙනුවෙන් ජීවිතය පුරා ක්‍රියාත්මක වන ක්‍රියාධරයන් දන්නා පරිදි, ඇතැම් ක්‍රියාමාලාවන් එක්තරා ආකාරයක ප්‍රතිපත්ති වෙනස්  කිරීමෙහිලා වෙනත් ඒවාට වඩා සාර්ථක ය. පටු පරාසයක අර්ථ නිරූපණය කරන ලද ක්‍රියාධර ඉල්ලීම් බොහෝ විට දුෂ්කර ප්‍රතිසංස්කරණවලට වඩා සාර්ථක වීමේ ඉඩක් තිබේ. එදිරිවාදී නීති අත්හිටුවීම හෝ ආන්දෝලනාත්මක නිෂ්පාදනයක් ඉවත් කිරීම සඳහා වන ඉල්ලීම් එසේ පටු පරාසයක අර්ථකථනය කරන ලද ඉල්ලීම්වලට උදාහරණ වේ. පෙට්‍රෝලියම් මත රඳාපැවැත්ම නැති කිරීම හෝ ප්‍රතිපත්ති කඩ නොකරන දේශපාලනයක් වැනි ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම දුෂ්කර ඒවා ය.

මෙම යථාර්ථය ඩිජිටල් සක්‍රීය වීමට ද සත්‍යයකි. නිශ්චිත ජයග්‍රහණ සමරන අතර, ක්‍රියාධරයන් කල්ගත වන, ප්‍රයත්නයක් හා සංවාදයක් අවශ්‍ය සමාජ, දේශපාලනික සහ වෙනත් ප්‍රතිසංස්කරණ වෙනුවෙන් දිගින් දිගට ම ක්‍රියා කළ යුතු ය. ඇතැම් ප්‍රතිසංස්කරණ සම්පූර්ණ කරගැනීමට පරම්පරා ගණනක් ගත වේ. සමාජ හෝ දේශපාලන පද්ධති තුළ ප්‍රතිපත්ති කඩකිරීම වළක්වාගැනීම සඳහා ක්‍රියාධරයන් අවදියෙන් කටයුතු කිරීම අවශ්‍ය ය.

එක්සත් ජනපද ලේඛක මැල්කම් ගැඩ්විල් පැවසූ පරිදි, “ගැඹුරට කාවැදුණු ප්‍රශ්නවලට පහර දෙමින් පවත්නා තත්වයට අභියෝග කරමින් සක්‍රීය වීම දුබල හදවත් ඇති අයට කළ නොහැක්කකි.”

## සිද්ධි අධ්‍යයනය

### සිද්ධි අධ්‍යයන 1: බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ වහල් වෙළඳාම අහෝසි කිරීම

ලෝක ඉතිහාසයේ වඩාත් ම අධිෂ්ඨානශීලී සමාජ ක්‍රියාධරයෙක් වන්නේ විලියම් විල්බර්ෆෝස් (1759 - 1833) ය. බ්‍රිතාන්‍ය දේශපාලනඥයකු, පරිත්‍යාගශීලියකු වන ඔහු බ්‍රිතාන්‍ය නැව්වලින්, අතිශය නින්දිත තත්වයන් තුළ, අප්‍රිකාවේ සිට කළු පහලු�න් බටහිර ඉන්දියාවට රැගෙන ගොස් විකිණීමේ වහල් වෙළඳාම අහෝසි කිරීමේ වෙනුවෙන් ක්‍රියා කළ සමාජ ව්‍යාපාරයේ නායකයෙකි.

ක්‍රියාමාලාකරුවකු ලෙස ඔහු මුලින් ම සිදු වන දෙය අධ්‍යයනය කළේ ය. ඔහු, අප්‍රිකාවේ වහලුන් අල්ලාගැනීමේ දී සහ ගැඹුරු මුහුදේ වහල් ප්‍රවාහනයේ දී සිදුවන මහා මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ පැහැදිලි සාක්ෂි එක්රැස් කරගත්තේ ය. ඒ අතර ඇසින් දුටු සාක්ෂි ද විය. ඉන් අනතුරුව ඔහු එම කරුණු හා සංඛ්‍යා භාවිතා කරමින් ඒ ගැන ලිව්වේ ය. කතා කළේ ය. මානව හැඟීම් ආමන්ත්‍රණය කළේ ය. වහල්භාවය අහෝසි කිරීම සඳහා පෙත්සමකට ඔහු සාමාන්‍ය මිනිසුන්ගෙන් ලක්ෂ තුනකට වඩා අත්සන් එකතු කරගැනීමට සමත් විය. දුරු රටක සිදුවන මෙම මානව හිමිකම් උල්ලංඝණයන් ගැන සාමාන්‍ය මිනිසුන් සැළකිලිමත් නොවන බවට පැවති දේශපාලන තර්කනය එයින් බිඳ දැමිණි.

ප්‍රගතිශීලී ක්‍රිස්තියානි නායකයන් සමග වැඩ කළ ඔහු තම පණිවිඩය පතුරුවා හැරීම සඳහා පල්ලි භාවිතා කළේ ය. මෙම තනි ප්‍රශ්නය වෙනුවෙන් ක්‍රියාත්මක වීම උදෙසා ඔහු පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ ය. වහල් ශ්‍රමය භාවිතා කරමින් කරනු ලබන වගාවන්ගේ සීනි නිෂ්පාදන සම්බන්ධයෙන් ඔහු පාරිභෝගික වර්ජන සංවිධානය කළේ ය.

විල්බර්ෆෝස් සිය ක්‍රියාමාලාව ආරම්භ කර සම්පූර්ණ වසර 20කට පසුව 1807 දී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව වහල් වෙළඳාම අහෝසි කරන පනත සම්මත කරන ලදී. ඔහු ඊළඟට ක්‍රියාත්මක කළේ එම නීති නිසි ලෙස ක්‍රියාත්මක වනවා ද, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය පුරා ම වහල් සේවය අහෝසි වෙනවා ද යන්න පිළිබඳ සොයාබැලීමයි.

'Amazing Grace' යනු 2006 වසරේදී මයිකල් ඇප්ටඩ් විසින් විලියම් විල්බර්ෆෝස්ගේ ජීවිතය හා ක්‍රියා පදනම් කරගෙන නිර්මාණය කරන ලද චරිතාපදාන චිත්‍රපටයකි.

විල්බර්ෆෝස් විසින් වසර 200කට ඉහතදී ක්‍රියාත්මක කරන ලද මූලෝපායන් මෙම ඩිජිටල් යුගයේදී ද වලංගු ය.

Read more: https://www.christianitytoday.com/history/people/activists/william-wilberforce.html

## සිද්ධි අධ්‍යයනය 2: කළු ලස්සනයි

ශ්‍රී ලංකාව ද ඇතුළුව දකුණු ආසියාවේ බොහෝ තැන්වල තිබෙන විශ්වාසයක් වන්නේ සමේ පැහැයේ සුන්දරත්වය වන්නේ සුදු පැහැය බවයි. ඉන්දියාවේ බ්‍රිතාන්‍ය පාලනය සමයේ වඩා තද පැහැති සම ඇති පුද්ගලයන් සමාජමය සහ ආර්ථික වශයෙන් අවාසිදායක තත්වයකට පත් විය. බ්‍රිතාන්‍යයන් ඉන්දියාව අතහැර ගොස් දශක ගණනකට පසුව පවා 'වර්ණභේදවාදී' යටත් විජිත ආකල්පය ඉතිරිව තිබිණි.

මෙම සමාජ ආකල්පය හේතුවෙන් කාන්තාවන් සහ ගැහැණු ළමයින් දැඩි පීඩාවකට පත් වෙති. සුදු පැහැය ඇති කරන රූපලාවන්‍ය ද්‍රව්‍ය කර්මාන්තයට අමතරව බ්ලීච්ං, රසායනික ලෙස මතුපිට ඉවත් කිරීම්, ලේසර් ප්‍රතිකාර, හෝමෝන ප්‍රතිකාර සහ නහරගත එන්නත් ආදී විවිධ සෞඛ්‍ය අවදානම් සහිත ක්‍රියාමාර්ග ද තිබේ.

2009 දී 'කළු ලස්සනයි' (Dark Is Beautiful) ක්‍රියාමාලාව දියත් කරනු ලැබුවේ මෙකී වර්ණවාදයට එරෙහිව අරගල කිරීම සඳහා ය. සමාජය විසින් සමේ වර්ණය හේතු කරගෙන සිදු කරනු ලබන වෙනස්කම්වල ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමුකරමින් මිලියන් ගණන් සෑම වයසක ම පුද්ගලයන්ගේ ස්වයං අභිමානය නැංවීම මෙම ව්‍යාපාරයෙහි අරමුණයි.

මෙම ව්‍යාපාරය ආරම්භ කරනු ලැබුවේ කවිතා එම්මානුවෙල් විසින් Women of Worth (WOW) නම් ලාභ නොලබන සංවිධානය හරහා ය. එයට බොලිවුඩ් නිළි නන්දිතා දාස් වැනි කීර්තිමත් පුද්ගලයන් විසින් දායකත්වය ලබා දී තිබේ. මෙම ව්‍යාපාරය විසින් පාසල්වල මාධ්‍ය සාක්ෂරතා වැඩමුළු සහ උද්දේශන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒවායේ අරමුණ වන්නේ ස්වයං අභිමානය සහ ස්වයං වටිනාකම පිළිබඳ ළමයින් අතරට පණිවුඩ සන්නිවේදනය කිරීමයි.

සමේ පැහැය හේතුවෙන් ලද පෞද්ගලික අත්දැකීම් බෙදාහදාගැනීම සඳහා සංසදයක් ලෙස බ්ලොග් අඩවියක් භාවිතා කෙරේ.

මෙම ක්‍රියාමාලාව ආරම්භ කර දශකයක් තුළ 'කළු ලස්සනයි' ව්‍යාපාරයට ජාත්‍යන්තර පිළිගැනීම ලැබී තිබේ. මේ හා සමාන සමාජ ආකල්ප ඇති රටවල එවැනි ක්‍රියාමාලා ආරම්භ කර තිබේ. ඉන්දියාවේ ප්‍රචාරණ ප්‍රමිති කවුන්සිලය විසින් 2014 දී කළු සම ඇති පුද්ගලයන් පහත් ලෙස දක්වන දැන්වීම් තහනම් කරමින්, සමේ පැහැය මත වෙනස්කම් සිදුකරන ප්‍රචාරණයන් තහනම් කරන ලදී. එහෙත්, එවැනි ඇතැම් නිෂ්පාදන තවමත් වෙළඳපොළේ තිබේ.

කවිතා එම්මානුවෙල් විශ්වාස කරන පරිදි, ඉන්දියාවේ පමණක් නොව, මුළු ලෝකයේ ම ජනතාව ප්‍රශ්න පිළිබඳ දැනුවත් වන විට ඊළඟ පරම්පරාව හෝ වෙනස් අන්දමින් දකින්නට පෙළඹෙනු ඇත.

Read more: http://www.darkisbeautiful.in/
https://thewire.in/business/skin-lightening-industry

## සිද්ධි අධ්‍යයන 3: හෑෂ්ටැග් ජෙනරේෂන් (HASHTAG GENERATION)

හෑෂ්ටැග් ජෙනරේෂන් යනු තරුණයන් පදනම් කරගත්, තරුණයන් නායකත්වය දෙන ශ්‍රී ලාංකික උද්දේශන කණ්ඩායමකි. 2015 ජුනි මස ආරම්භ කරන ලද එහි අරමුණ වන්නේ “ශ්‍රී ලංකාවේ පුරවැසි සහ දේශපාලන අවකාශයේ අරුත්බර තරුණ සහභාගිත්වය සම්බන්ධයෙන් පවතින රික්තය පිරවීමයි.”

නිර්මාණාත්මක, පහසුවෙන් තේරුම්ගත හැකි සහ තරුණ හිතවාදී ඩිජිටල් රූපසටහන් සහ උද්දේශන ක්‍රියාමාලා ඔස්සේ වැදගත් ප්‍රශ්න සම්බන්ධයෙන් දැනුවත්භාවය හා සංවාද ඇතිකිරීමේ ඵලදායී වේදිකාවක් ලෙස ඔවුන් විසින් සමාජ මාධ්‍ය හඳුනාගන්නා ලදී. කෙසේ වෙතත්, මෙම කණ්ඩායම පුළුල් වන විට හෑෂ්ටැග් ජෙනරේෂන් විසින් භෞතික සමාජයේ ද ක්‍රියාමාලා සහ ව්‍යාපෘති කිහිපයක් කරන ලදී.

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වැඩකිරීම සම්බන්ධයෙන් හෑෂ්ටැග් ජෙනරේෂන් කීර්තිමත් ය. නව නිර්මාණාත්මක සහ පරිකල්පනීය, රූප මාධ්‍යයෙන් දිවෙන සන්නිවේදන ප්‍රවේශයන් සම්බන්ධයෙන් ද ඔවුන් ප්‍රසිද්ධ ය. ඔවුන් ක්‍රියාකාරී වැඩසටහන් කීපයක ම ක්‍රියාත්මක ය. හැමවිට ම, වැදගත් ජාතික විවාදවලට සහ ක්‍රියාවලිවලට තරුණ දැක්ම ගෙන එයි. ඒ අතර, ජනවාර්ගික සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම, සංක්‍රාන්ති යුක්තිය, කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම (#HerSafeSpace), ලිංගික සුළුතරයන්ගේ සමානාත්මතාව සහ කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය (විශේෂයෙන් ම පළාත් පාලන ආයතනවල 25% කාන්තා නියෝජනය) තිබේ.

Read more: https://www.facebook.com/hashtaggenerationsl/

## සිද්ධි අධ්‍යයනය 4: BAKAMOONO.LK

Bakamoono.lk යනු තමන්ට හා අනුන්ට ද, වෙනස්කම්වලට ද ගරු කිරීම ප්‍රවර්ධනය කරන වෙබ් අඩවියක් හා සමාජ මාධ්‍ය වේදිකාවකි. ඔවුන් තමන්ව ම විස්තර කරගන්නේ මෙසේ ය: "Bakamoono.lk යනු, අප අවට සම්බන්ධතා, ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යය, HIV, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ අප කැමති අය බවට පත් වීමට අපට තිබෙන අයිතිය සමග කටයුතු කිරීමේදී, සංවේදී වීම, බුද්ධිමත් වීම පිළිබඳවයි."

මෙම කණ්ඩායම විසින් bakamoono.lk, The Grassrooted Trust, Positive Hopes Alliance, Lanka Plus, National Union of Seafarers in Sri Lanka (NUSS), National Union of Metal & Migrant Workers in Sri Lanka සහ ස්වේච්ඡා ක්‍රියාකාරිත්වයන් පවත්වාගෙන යනු ලැබේ. විවිධ ලිංගික නැඹුරුතා සහ ස්ත්‍රී පුරුෂ අනන්‍යතා ඇති අය, වෛද්‍ය සහ නීති වෘත්තිකයන් ආදී ලාංකිකයෝ ඒ සමග කටයුතු කරති.

Bakamoono.lk පළමු අදියර අවධානය යොමු කළේ HIV කෙරෙහි ය. එය පැතිරෙන ආකාරය, වළක්වාගත හැකි ආකාරය සහ ආසාදිතයන්ට උපකාර ලබාගත හැකි ආකාරය පිළිබඳ ලාංකික පුරවැසියන්ට දැඩිව අවශ්‍යව තිබුණු විද්‍යාත්මක සහ නිවැරදි තොරතුරු පරිසමාප්ත ලෙස ලබා දීම ඔවුන් විසින් කරන ලදී. ලිංගිකභාවය සහ සම්බන්ධතා කෙරෙහි ද එහි අවධානය යොමු විය. ඒ තුළට කැමැත්ත, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සයිබර් සූරාකෑම, ප්‍රචණ්ඩත්වය සහ දුෂ්කර අවස්ථාවලදී පිහිට පැතිය හැකි රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සේවා ආදිය කෙරෙහි ද අවධානය යොමු කරයි.

Bakamoono.lk යනු විද්‍යාත්මක පදනමක් සහිත සහකම්පනය මත ක්‍රියාත්මක වන ප්‍රයත්නයකි. ශ්‍රී ලංකාවේ සංස්කෘතික වශයෙන් තහනම් විෂයයන් පිළිබඳ එහිදී සංවාද කෙරේ.

Read more: http://www.bakamoono.lk/en

## සිද්ධි අධ්‍යයනය 5: **#MeToo**

සමාජ මාධ්‍ය භූමිකාව සම්බන්ධයෙන් වැදගත් මෑතකාලීන ක්‍රියාමාලාවක් වන්නේ "Me Too" ව්‍යාපාරයයි. ලිංගික හිංසනය සහ ප්‍රහාර සම්බන්ධ මෙම ව්‍යාපාරය තනි සමාජ මාධ්‍ය පළකිරීමක් ගෝලීය වශයෙන් කොපමණ පැතිරවිය හැකි ද යන්න පිළිබඳ නිදසුනකි.

2017 ඔක්තෝබර් 15 දා ඇමරිකානු නිළියක හා ගායිකාවක වන ඇලිසා මිලානෝ ට්විටර්හි සටහනක් තබමින් මෙසේ පැවසුවා යː "ඔබ ලිංගික හිංසනයකට හෝ ප්‍රහාරයකට ලක් වී නම් මෙම ට්වීටයට 'me too' ලෙස පිළිතුරක් දෙන්න." ඇය විසින් අවධාරණය කරන ලද හෑෂ්ටැගය ඔස්සේ නිර්මාණය කරන ලද වේදිකාවෙහි කාන්තාවන්ට "තමන් කැමති නම්, සිදු වූ දේ පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබිණි."

එයට ලැබුණු ප්‍රතිචාරය අතිමහත් විය. 24 පැයක් තුළ ඇගේ පළකිරීමට දහස් ගණනක් පිළිතුරු, කමෙන්ට් හා ප්‍රති ට්වීට් කිරීම් ලැබිණි. ලොව පුරා තවත් දහස් ගණනක් මුල් පළකිරීම් ඔස්සේ කාන්තාවන් සහ පිරිමින් තම අත්දැකීම් විස්තර කළ හ. බොහෝ ජනයාට කියන්නට #MeToo කතන්දර තිබීම ගැන මිලානෝ පුදුම වූයේ නැත. එහෙත්, ඇය පුදුම වූයේ, සමාජ මාධ්‍ය ඔස්සේ එම කතා කීමේදී පුද්ගලයන් කෙතරම් අව්‍යාජ වී ද යන්න ගැනයි.

Me Too සමාජ ව්‍යාපාරයක් ලෙස ආරම්භ කරනු ලැබුවේ දශකයකට පෙර, නිව්යෝක්හි බ්‍රුක්ලින්හි ටරානා බර්ක් නම් සිවිල් හිමිකම් ක්‍රියාකාරිනියක් විසිනි. 2006 දී බර්ක් විසින් නැවත වරක් Me Too සමාජයේ පවතින ලිංගික අපචාර සහ ප්‍රහාරවල සුලබතාව පිළිබඳ දැනුවත්භාවය අවදි කිරීම සඳහා යොදාගන්නා ලදී. එම යෙදුම 2017 වසරේදී හෑෂ්ටැගයක් ලෙස භාවිතා කිරීමෙන් පසු එය පුළුල් ව්‍යාපාරයක් බවට පත් විය. මිලානෝගේ ට්විටර් සටහන සහ හොලිවුඩ් ප්‍රබලයකු වූ හාවි වෙයින්ස්ටෙයින්ට එරෙහි අපචාර අවලාද එහිදී ප්‍රමුඛ විය.

ලොව පුරා පැතිර ගිය "Me Too" ව්‍යාපාරයේ බලපෑම ශ්‍රී ලාංකික සමාජ මාධ්‍යවල ද කෙටියෙන් දක්නට ලැබිණි. එම අවස්ථාව භාවිතා කරමින් සිය ගණනක් ශ්‍රී ලාංකික කාන්තාවෝ තම අත්දැකීම් බෙදාගත් හ. ඉන්දියාව වැනි රටවල එය බෙහෙවින් සාර්ථක විය. එහි පුද්ගලයන් විසින් වැරදි කරන්නන් නම් කර ලජ්ජාවට පත් කරන ලද අතර වැරදි කරන්නන්ට එහි ප්‍රතිඵලවලට ද මුහුණ දෙන්නට සිදු විය.

[ලිංගික හිංසනයක් හෝ ප්‍රහාරයක් පිළිබඳ ශ්‍රී ලාංකික ඔබට කිසිවෙකු සමග කතා කිරීමට අවශ්‍ය නම්, කාන්තා පිහිට සංවිධානය සමග ඔවුන්ගේ වෙබ් අඩවිය ඔස්සේ හෝ 011 4718585 දුරකථන අංකය ඔස්සේ සම්බන්ධ වන්න.]

Read more: https://metoomvmt.org/about/
https://www.vox.com/identities/2018/10/9/17933746/me-too-movement-metoo-brett-kavanaugh-weinstein
https://www.bbc.com/news/world-asia-india-47025662

## සාකච්ඡා කරුණු

පහත දැක්වෙන්නේ මෙම මාතෘකාව පිළිබඳ වැඩිදුරටත් අධ්‍යයනය කරන්නට යොදාගත හැකි ප්‍රශ්න හා සාකච්ඡා මාතෘකා කීපයකි.

- මහත්මා ගාන්ධි ඉතිහාසයේ ඵලදායී දේශපාලන ක්‍රියාධරයකු වූයේ කෙසේ ද? ඔහුගේ අවිහිංසාවාදී ක්‍රියාශීලී වීමේ බලපෑම මගින් මාටින් ලූතර් කිං (කණිෂ්ඨ), නෙල්සන් මැන්ඩෙලා වැනි අයට සිදු වුණේ කෙසේ ද?

- භෞතික ලෝකයේ ක්‍රියාශීලී වීම, ශ්‍රී ලංකාව වැනි රටවලට විශේෂයෙන් ම තවමත් අවශ්‍ය ඇයි? සියලු ක්‍රියාශීලී වීම් සහ උද්දේශනයන් සමාජ මාධ්‍ය ඔස්සේ පමණක් සිදු කළ නොහැක්කේ ඇයි?

- මීම්, හෑෂ්ටැග් සහ අන්තර්ජාල පෙත්සම් හැරුණු විට ඩිජිටල් ලෙස සක්‍රීය වීමට ප්‍රයෝජනවත් විය හැකි අනෙකුත් මෙවලම් සහ මූලෝපායන් මොනවා ද?

- මෑත කාලයේදී කිසියම් මට්ටමකින් බලපෑමක් ඇති කළ ඩිජිටල් සක්‍රීය වීමට ජාතික හෝ ප්‍රාදේශීය මට්ටමේ උදාහරණයක් ඔබට නම් කළ හැකි ද?

- අන්තර්ජාලයේ සහ භෞතික සමාජයේ ක්‍රම තමන් සමාජ වෙනස්කම් වෙනුවෙන් කරන ක්‍රියාමාලාවලදී සාර්ථක ලෙස සම්බන්ධ කරන සිවිල් සමාජ සංවිධානයක් හෝ උද්දේශන කණ්ඩායමක් ගැන ඔබ දන්නවා ද?

- ඔබ කිසියම් දිනෙක අන්තර්ජාල පෙත්සමක් අත්සන් කර තිබේ ද? එසේ නම්, ඒ කුමන ප්‍රශ්නයක් හෝ මාතෘකාවක් යටතේ ද යන්න සහ අවසන් ප්‍රතිඵලය ගැන සාකච්ඡා කරන්න.

- ඩිජිටල් සක්‍රීය වීමේ එක් විවේචනයක් වන්නේ ක්‍රියාකාරිත්වයේ තිබෙන්නේ සුළු බලපෑමක් බවයි. ඒ වෙනුවට පුද්ගලයන්ට තමන් ඒ වෙනුවෙන් දායක වී යයි තෘප්තියක් ඇති කරයි. මෙයට ස්ලැක්ටිවිස්ම් (slacktivism) යයි කියනු ලැබේ. ඔබ මෙයට එකඟ ද? සාකච්ඡා කරන්න.

- #MeToo ව්‍යාපාරය ආරම්භ වූයේ බටහිර රටක වුණත්, ඉක්මණින් ම එය ලොව වෙනත් කොටස්වලට ද පැතිරිණි. එමගින් ලිංගික හිංසනයට සහ වධයට ලක් වූ කාන්තාවන් ඒ පිළිබඳ කතාකිරීමට සහ තම වැරදිකරුවාගේ නම හෙළිදරව් කිරීමට පවා බලසතු කරන ලදී. #MeToo ඉන්දියාවට පැමිණි මුත් ශ්‍රී ලංකාවේ ජනප්‍රිය වූයේ නැත. 2019 වසර මැදභාගය වන තුරු ම ශ්‍රී ලංකාවේ එය සිදු නොවූයේ ඇයි? ඔබ සිතන්නේ කුමක් ද?

## ඉගෙනුම් ප්‍රතිඵල

මෙම මොඩියුලය අවසානයේදී ඔබ විසින් පහත දැක්වෙන කරුණු අවබෝධ කරගනු ඇත:

- සක්‍රීය වීම උද්ඝෝෂණයට වැඩි දෙයකි. වඩාත් ම ඵලදායී ක්‍රියාකාරිකයන් වන්නේ තමන් උද්දේශනය කරන ප්‍රශ්නය විවිධ ක්‍රමවලින් විශ්ලේෂණය කරන, පුළුල්ව සවන් දෙන සහ විසඳුම් හඳුනාගන්නා අයයි.
- යහපත් පොදු සන්නිවේදනය යනු සක්‍රීය වීමේ වැදගත් කොටසකි. තාක්ෂණය සංවර්ධනය වන විට සක්‍රීය වීම් සඳහා වැඩිපුර මෙවලම් ලැබිණි. ඒවා නම්, මුද්‍රිත මාධ්‍ය, රේඩියෝ, රූපවාහිනී, වෙබ් සහ සමාජ මාධ්‍ය ආදියයි.
- ඩිජිටල් සක්‍රිය වීම සයිබර් සක්‍රීය වීම ලෙස ද හැඳින්වේ. එය අන්තර්ජාලය සහ ඩිජිටල් තාක්ෂණයන් භාවිතයෙන් දැනුවත්භාවය වර්ධනය කිරීමේ, බලමුළුගැන්වීමේ සහ ක්‍රියා කිරීමේ ස්වරූපයකි.
- ඕනෑම ආකාරයක සක්‍රිය වීමක් ඵලදායී වීමට නම් එය විසින් රටේ සමාජ, දේශපාලනික සහ සංස්කෘතික යථාර්ථයන් අවබෝධ කරගැනීම අත්‍යවශ්‍ය ය. මේ හේතුව මත, ගෝලීයව සිදුවන සක්‍රිය වීම් දේශීයකරණය කළ යුතු ය.
- ඩිජිටල් සක්‍රිය වීමේ යෙදෙන අයට විවිධ මූලෝපායන් සහ මෙවලම් තිබේ. ඒවා නම්, හෑෂ්ටැග්, මීම්, අන්තර්ජාල පෙත්සම් ආදියයි. එමගින් ප්‍රජාවන් ගොඩනැගිය හැකි අතර සංවාදයේ යෙදිය හැකි ය.
- ද්වි මාර්ගික සන්නිවේදනය අන්තර්ජාල සක්‍රීය වීමේ දී සහ උද්දේශනයේ දී අත්‍යවශ්‍ය ගුණයකි. ක්‍රියාධරයන් නිරතුරුව ආධාරකරුවන් සමග මෙන් ම කුතුහලය දක්වන හා විවේචනාත්මක වන අය සමග ද සම්බන්ධ විය යුතු ය.
- සමාජ, මානවවාදී සහ දේශපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාමාලා සංඛ්‍යාව වැඩි වෙමින් තිබේ. ශ්‍රී ලංකාව තුළ ඒවා ප්‍රවර්ධනය කරනු ලබන්නේ ඩිජිටල් සක්‍රීය වීම් ඔස්සේ ය. ඒ හැම එකක් ම සමාන අන්දමින් ඵලදායී වී නැත. ඩිජිටල් සක්‍රීය වීම වෙත ඇතුළත් වීමට කැමති සැමට ඒවා වටිනා අත්දැකීම් ය.

## වැඩිදුර කියවීම්

2018 අන්තර්ජාල නිදහස පිළිබඳ වාර්තාව
https://freedomhouse.org/report/freedom-net/2018/sri-lanka

සමාජ මාධ්‍ය යුගයේ සක්‍රීය වීම
https://www.pewinternet.org/2018/07/11/activism-in-the-social-media-age/

සමාජ මාධ්‍යවල සක්‍රීය වීම: සංස්කරණය කරන ලද මාර්ගෝපදේශයක්
https://ourdataourselves.tacticaltech.org/posts/23_guide_social_media/

විකේතීකරණය කරන ලද ඩිජිටල් ක්‍රියාකාරිත්වය: වෙනසේ නව යාන්ත්‍රණයන්
https://www.opensocietyfoundations.org/publications/digital-activism-decoded-new-mechanics-change

අවාස් පිටුපස සිටින මිනිසා: එක් වරකට එක් ක්ලික් කිරීමකින් අපට ලෝකය වෙනස් කළ හැකි ද? රිකන් පාටෙල්, තරුණ කැනේඩියානුවකු එසේ සිතයි. 1843 සඟරාව, මැයි/ ජුනි 2013
https://www.1843magazine.com/content/features/robert-butler/man-behind-avaaz

උද්දේශනය සඳහා තොරතුරු දෘෂ්‍යකරණය, උපායික තාක්ෂණික සාමූහිකයේ 2013 පොත
https://visualisingadvocacy.org/

මානව හිමිකම් වෙබ් අඩවියේ තොරතුරු දෘෂ්‍යකරණය පිළිබඳ මාර්ගෝපදේශයේ නව උපායන්
https://www.newtactics.org/conversation/visualizing-information-advocacy

අන්තර්ජාල සක්‍රීය වීමේ ආචාරධර්ම: සමාජ ක්‍රියාකාරිත්වයේ හෝ වෙනසෙහි ඵලදායී මූලාශ්‍රවල ව්‍යාජ සංවේදනා,
Fordham University Center for Ethics Education, 2016.
https://ethicsandsociety.org/2016/02/17/ethics-in-online-activism-false-senses-of-social-action-or-effective-source-of-change/

Kony 2012 සමාජ මාධ්‍ය සක්‍රීය වීමක් ද? නැතිනම් හුදු ස්ලැක්ටිවිස්ම් ද? මාධ්‍ය ආචාරධර්ම මුලපිරුම
https://mediaethicsinitiative.org/2019/02/27/the-ethics-of-online-activism/